### අගය එකතු කරන තරඟකාරී කෘෂිකර්මාන්තයකට මුල්තැන

අපගේ ජන ජීවිතය සමඟ ඉතාමත් තදින් බැඳී පවතින කෘෂිකර්මාන්තයේ ඵලදායීතාවය නංවමින් ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු කෘෂි නිෂ්පාදන සිදුකිරීමට අපි ගොවිමහතුන් දිරිමත් කරනවා. මෙමඟින් වඩාත් අගය එකතු කළ කෘෂි නිෂ්පාදන වඩ වඩාත් අපනයනය කිරීම තුළින් ඉහළ විදේශ විනිමයක් උපයා ගැනීමට හැකි වෙනවා. අප සතු සාඩම්බර කෘෂි උරුමයට නව පණක් ලැබෙන්නේ එවිටයි.

### ඉඩම්, ශ්‍රමය හා ප්‍රාග්ධන වෙළඳපොළ ප්‍රතිපත්ති ගැන අලුතෙන් හිතමු

මේ කරුණු තුන ගැන දැඩි සැලකිල්ලක් නොදැක්වුවහොත් බලාපොරොත්තු ඉලක්කවලට යන්නට බැහැ. යල්පැනගිය ඉඩම් ප්‍රතිපත්ති වෙනස් වෙන්න ඕනෑ. ධනාත්මක චින්තනය සහිත ශ්‍රම බලකායක් ඇති කරලා, සේවක-සේව්‍ය සම්බන්ධතා ශක්තිමත් කරලා, නිෂ්පාදන ධාරිතාව වැඩිකරන්න ඕනෑ. පෞද්ගලික අංශය සංවර්ධනයට දායක කරගන්න නම් ප්‍රාග්ධන වෙළඳපොළත් තව පුළුල් විය යුතුයි.



### අධ්‍යාපනය, සෞඛ්‍යය, පරිසරය වැනි අංශ ගැනත් අවධානය ඕනෑ

අපි කියන මේ පොහොසත් රට හදන්න අධ්‍යාපනය, සෞඛ්‍යය, පරිසරය සහ අනෙක් යටිතල පහසුකම් ද එක හා සමානව දියුණු විය යුතුයි. හැම පුරවැසියෙකුටම හිසට වහලක්, බොන්න පිරිසිදු වතුර ටිකක්, පෝෂ්‍යදායී ආහාර වේලක්, හොඳ ප්‍රවාහන පද්ධතියක් වගේම හුස්ම ගන්න පිරිසිදු වාතාශ්‍රයකුත් තියෙන්න ඕනෑ. අපේ ඓතිහාසික, සංස්කෘතික හර පද්ධතිය රැකගන්නත් ඕනෑ.



### තාක්ෂණය හා ඩිජිටල්කරණය නැතුව මේ ගමන යන්න බැහැ

දවසින් දවස තාක්ෂණය වෙනස් වෙනවා. ආර්ථික සංවර්ධනය මේ යතාර්ථයෙන් වෙන් කරන්න බැහැ. ඒ නිසා ඩිජිටල්කරණයෙන් ශක්තිමත් ආර්ථිකයක් හදන්න නම් අපේ සංවර්ධන උපායමාර්ග ඒ වෙනස්කම්වලට අනුගත වෙන්න වෙනවා.



### විශ්‍රාම වැටුප, සමෘද්ධිය විධිමත් කරලා සමාජය රැකබලා ගනිමු

විශ්‍රාම වැටුප දැන් ලැබෙන්නේ රජයේ සේවකයින්ට විතරයි. හරිනම් ශ්‍රමබලකායේ හැම කෙනෙක්ටම විශ්‍රාම ප්‍රතිලාභයක් ලැබෙන්න ඕනෑ. සමෘද්ධිය ලැබීමේත් විවිධ ප්‍රශ්න තියෙනවා. ඇතැම් අඩු ආදායම් ලාභීන්ට මුකුත්ම ලැබෙන්නේ නැහැ. මේ ක්‍රමය වෙනස් වෙන්න ඕනෑ. පොහොසත් රටක් හැදෙන්නේ කාටත් ප්‍රතිලාභ ලැබෙන ශක්තිමත්, සාධාරණ සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළක් තිබුනොත් විතරයි.

### තිරසාර සංවර්ධනය මේ ගමනේ පදනමයි

තිරසාර සංවර්ධන ප්‍රතිපත්තියට අනුගත නොවී ආර්ථික සංවර්ධනය ගැන විතරක් හිතුවොත් අනාගත පරපුරට රටක් ඉතිරි වෙන්නේ නැහැ. පරිසරය අම්මා තාත්තා වගේ රැකබලා ගන්න ඕනෑ. කෘෂිකර්මය අනිවාර්යයෙන්ම දියුණු කරලා මේ රටේ ආහාර සුරක්ෂිතතාව සහතික කරන්න ඕනෑ. රටේ හැම පළාතකට ම සමසේ සංවර්ධන ප්‍රතිලාභ බෙදී යන්න ඕනෑ. විදුලිබල හා බලශක්තියට යන ඉහළ වියදමත් අඩු කරන්න ඕනෑ. පරිසරයට හානි නොවෙන විදියට බලශක්ති නිපදවන ක්‍රම ඇති කරන්න ඕනෑ.



මෑතකදී අපි දැක්ක තවත් ප්‍රවණතාවක් තමයි රටේ ස්වභාවික විපත් නිතර නිතර සිදුවීම. ඒවා වළක්වා ගන්නත්, සිදුවුණු ආපදාව මනාව කළමනාකරණය කර ගන්නත් සුදුසු ක්‍රමවේද අපි ළඟ තිබිය යුතුයි.

### මේ ඔක්කොම කරන්න නම් ජනතාවට වග කියන ආණ්ඩුවක් – ආණ්ඩුක්‍රමයක් ඕනෑ

පොහොසත් රටක් හදන්න මේ කාරණය නැතුව බැහැ. ආණ්ඩුවත්, ආණ්ඩුවේ ආයතනත් ප්‍රතිසංස්කරණය කරන පුළුල් වැඩපිළිවෙළක් අපි ආරම්භ කළේ ඒ නිසයි. වංචාව, දූෂණය අවම කරලා කාර්යක්ෂමතාව උපරිම කරන්න සෑම උත්සාහයක්ම ගත යුතුයි. ජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතිය නීතිගත කළේ ඒ නිසයි. ග්‍රාම රාජ්‍ය සංකල්පය මත පිහිටලා ජනතා සහභාගිත්වය ඇති ආණ්ඩුක්‍රමයක් ඇති කිරීම අත්‍යවශ්‍යයි. එහි මූලික කටයුතු දැනටමත් අරඹලා ඉවරයි.


### පසුවිපරම සහ සම්බන්ධීකරණය අත්‍යවශ්‍යමයි

ඕනෑම කටයුත්තක් සාර්ථක වෙන්න නම් පසු විපරම සහ සම්බන්ධීකරණය ඒ කටයුත්තේ මූලික අංගයක් වෙන්න ඕනෑ. ආණ්ඩුව අතර සම්බන්ධීකරණය වගේම ආණ්ඩුව හා පෞද්ගලික අංශය අතර සම්බන්ධීකරණය තිබිය යුතුමයි. මේ කටයුත්තට නවීන තාක්ෂණයත් යොදා ගන්න වේවි.

---



**සමාජ සාධාරණත්වය සහ වෙළඳපොළ තරඟකාරීත්වය සුසංයෝග වූ සියලු දෙනාටම ප්‍රතිලාභ හිමිවන දැනුම පදනම් කරගත් ඉහළ තරඟකාරී සමාජ වෙළඳපොළ ආර්ථිකයක් ගොඩනගන්නයි.**



# 2025 දී පොහොසත් රටක්

2015 ජනවාරියේ දී හා අගෝස්තුවේ දී මේ රටේ ජනතාව සිය සර්වජන ඡන්ද බලය පාවිච්චි කළේ දේශපාලන සංස්කෘතියේ වෙනසක් සඳහායි. සුපිරිසිදු හා නිවැරදි දේශපාලනයකටත්, අන්තවාදයට එරෙහි යහපාලනයකටත් පක්ෂව ඔවුන් සිය කැමැත්ත ප්‍රකාශ කළා.

මානව අයිතීන් සුරකින, එකිනෙකාට ගරු කරමින් බහුත්වවාදය පිළිගන්නා, සමාන ප්‍රතිලාභ සැමට හිමිවන, ප්‍රජාතන්ත්‍රවාදී පොහොසත් රටක් ඔවුන්ගේ ප්‍රාර්ථනාවයි. ඒ පොහොසත්කම ආර්ථිකයට පමණක් සීමා වන්නේ නැත. දැනුමෙන්, සමාජ වටිනාකම්වලින්, ගුණදහමින්, ආකල්ප හා හැකියාවන්වලින්, නීලහරිත පරිසරයෙන් මේ රට පොහොසත් විය යුතුයි.

ඒ හීන හැබෑ කරන ගමනේ යෝධ පියවර කිහිපයක් ගෙවී ගිය වසර දෙක ඇතුළත මේ සම්මුතිවාදී ආණ්ඩුව ඉදිරියට තිබා ඇත. ජාත්‍යන්තරය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය යළි ගොඩනැගීම, 19 වැනි සංශෝධනය, කොමිෂන් සභා ස්ථාපිත කිරීම, තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම, මාධ්‍ය නිදහස තහවුරු කිරීම, අලුත් ව්‍යවස්ථාවකට පාර කැපීම, සංහිඳියා යාන්ත්‍රණයකට පිවිසීම එවැනි උදාහරණ කිහිපයකි.

ඒ වගේම ණය කන්දකට හිරවී තිබුණු ආර්ථිකය ගොඩගන්නා අතරතුරේ ජනතාවගේ අතමිට සරු කිරීමත් මේ ආණ්ඩුවට අභියෝගයක් විය. රට ණය උගුලෙන් බේරා ගන්න තව අවුරුදු දහයක්වත් ගත වේවි. ඒත් රාජ්‍ය සේවයේ හා පෞද්ගලික වැටුප් වැඩි වුණා. විශ්‍රාම වැටුප් වැඩි වුණා. ඉන්ධන, ගෑස්, ඖෂධ හා අත්‍යවශ්‍ය භාණ්ඩ රැසක මිල අඩු වුණා. ගමට කෝටියක් දුන්නා. සහන පොළියට සංවර්ධන ණය දෙනවා. පාසල් ළමයි රක්ෂණය කරනවා. ස්වභාවික විපත්වලදී ඉක්මන් සහන දුන්නා. මේ, කළ වැඩවලින් කොටසක් විතරයි.

**මේ සියලු උත්සාහය 2025 දී පොහොසත් රටක් හදන්නයි.** **සමාජ සාධාරණත්වය සහ වෙළඳපොළ තරඟකාරීත්වය සුසංයෝග වූ සියලු දෙනාටම ප්‍රතිලාභ හිමිවන දැනුම පදනම් කරගත් ඉහළ තරඟකාරී සමාජ වෙළඳපොළ ආර්ථිකයක් ගොඩනගන්නයි.** **ඒ කියන්නේ සෑම පුරවැසියෙකුටම හොඳ ආදායමක් සහ හොඳ ජීවන මට්ටමක් ඇති කරන්නයි.** **ඒක කරන්න නම් ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ ආර්ථික කේන්ද්‍රස්ථානය, එහෙමත් නැත්නම් මර්මස්ථානය බවට පත් කරන්න ඕනෑ.** **දේශීය වෙළඳපොළ ශක්තිමත් වෙලා අපගේ කෘෂිකර්මාන්තය, සේවා සහ කාර්මික අංශය ශක්තිමත් වෙලා සැමට සම අවස්ථා හිමිවන හොඳ ආර්ථිකයක් හැදෙන්නේ එතකොටයි.**

### මේ ගමනට තියෙන බාධා මොනවා ද?

අද තියෙන තත්ත්වය අනුව බාධාවන් බොහෝයි. රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේත්, යටිතල පහසුකම්වලත් ප්‍රශ්න එමටයි. ආයතන දුර්වලයි. ඒ හා සම්බන්ධ නීතිරීති බොහෝවිට යල්පැන ගිහින්. ඒවා ශක්තිමත් මදි. ඒ නිසා, මේ හැම ක්ෂේත්‍රයක්ම යළි නගා සිටුවිය යුතුයි. හැම ක්ෂේත්‍රයක්ම ප්‍රතිසංස්කරණ කළ යුතුයි.

### තුන් අවුරුදු කඩිනම් වැඩ පිළිවෙළ

2025දී පොහොසත් රටක් හදන්න නම් ඉදිරි අවුරුදු තුන ඇතුළත අපිට වැඩ ගොඩක් කරන්න තියෙනවා. ඉලක්ක කිහිපයක්ම සපුරා ගත යුතුව තියෙනවා. අපි වාර්ෂික ඒක පුද්ගල ආදායම එ. ජ. ඩොලර් 5,000 කට ගෙන එමින් රැකියා දස ලක්ෂයක් බිහි කරනවා. අපි තරඟකාරීත්වය දිරිගැන්වීම සහ විනිවිදභාවය ඇති කිරීම තුළින් දූෂණය නැති කිරීමට අපේක්ෂා කරමු.

### මේ වැඩපිළිවෙළට අලුත් දැක්මක් – අලුත් ප්‍රවේශයක් ඕනෑ

මේ ගමන සාර්ථකව යන්නට නම්, ආර්ථිකයේ තරඟකාරිත්වය හා ඵලදායීතාවය වැඩිකර ගන්න නම්, ඊට අදාළ හැම අංශයකම ප්‍රතිසංස්කරණ සිදුවෙන්න ඕනෑ. පෞද්ගලික ආයෝජන වැඩිකර ගෙන, දැනුම සහ තාක්ෂණය පදනම් කරගත් භාණ්ඩ හා සේවා වෙළඳපොළක් ගැන සිහින මවනවා නම් අලුත් දැක්මක් - අලුත් ප්‍රවේශයක් ඕනෑමයි.





### මුලින්ම ආර්ථික රාමුව සවිමත් කළ යුතුයි

ණය කන්ද, අයවැය පරතරය සහ වගකීමක් නැති මූල්‍ය ප්‍රතිපත්තිය අපේ ආර්ථික වර්ධනයට බාධා ඇති කරනවා. අපේ බදු ප්‍රතිපත්ති සමාජ සාධාරණයක් ඇති විදියට වෙනස් වෙන්න ඕනෑ. ආණ්ඩුව හා පෞද්ගලික අංශය එකට වැඩ කරන්න ඕනෑ. මූලික ආර්ථික රාමුව ශක්තිමක් වෙන්න ඕනෑ.


### වර්ධනයේ ඉඩකඩ පුළුල් කළ යුතුයි

රටට එන විදේශීය ආයෝජනවලට පහසුකම් සලසන්න අපිට තියෙන ඉඩකඩ සීමා සහිතයි. ඒ නිසා එවැනි ප්‍රතිපත්තීන් වෙනස් වෙන්න ඕනෑ. අපනයන ගැන වැඩි අවධානයක් දෙන ආයෝජන මෙරටට ගෙන්වා ගන්නත් වෙළඳපොළ මූලික පහසුකම් වැඩි කරන්නත්, රේගු ක්‍රමවේද ඉක්මන් සහ පාරදෘශ්‍ය කරන්නටත් අවශ්‍ය අලුත් වෙළඳ ප්‍රතිපත්තීන් හඳුන්වා දිය යුතුයි.



V2025 පොහොසත් රටක්

## මූලික සංවර්ධන ව්‍යාපෘති





**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**
නො. 163, කිරුලපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව **දුරකථනය**: +9411 251 5759 **ෆැක්ස්**: +9411 257 3756 **වෙබ්**: www.dgi.gov.lk